මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන් ඔස්සේ නිර්දේශ කෙරෙනුයේ, යම් පුවතකට අදාළ නොවන අවස්ථාවන් හිදී පුද්ගලයන්ගේ වාර්ගිකත්වයන් සඳහන් නොකරන ලෙසයි. මන්දයත්, සෘණාත්මක සන්දර්භයන් තුළ එසේ වාර්ගිකත්වයන් හුවා දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික විය හැකි බැවිනි.

"සා/පෙළ සිසුවියට අතවර කළ විභාග නිරීක්ෂක අත්අඩංගුවට" යන සිරස්තලය යටතේ මැයි 31, 2022 දින දිනමිණ පුවත්පතේ පළවූ ලිපියකි. ලිංගික අපරාධයක් පිළිබඳව වාර්තා කරන මෙම ලිපියේ අන්තර්ගතයෙහි සඳහන් වන්නේ, සිදුවීම සම්බන්ධව අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයා "මුස්ලිම් ජාතික" ගුරුවරයෙකු බවයි.

ඔබ සිතනා ආකාරයට,

1) මෙහිදී එම සැකකරුගේ වාර්ගිකත්වය පුවතට අදාළ වන්නේ කෙසේද?

2) වාර්ගිකත්වය සඳහන් නොකරමින් පවා, එම පුවතට හානියක් නොවන ලෙසින් එය වාර්තා කිරීමට නොහැකි ද?

3) එසේ වාර්ගිකත්වය හුවා දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වය සෘණාත්මකව ඒකාකෘතික වීමටත්, ඒ ඔස්සේ කොන් කිරීමකට ලක් වීමටත් ඉඩක් නොතිබෙන්නේ ද?

ඔබේ අදහස කුමක්ද?